DOI : 10.31357/fhssmst.2004.00680

# ශ්‍රී ලංකාවේ තේ වගා සාධක ඵලදායීතාව කෙරෙහි කුඩා තේ වතු සංවර්ධන සමිති බලපෑම

## රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරින්

වැල්හේනේගේ සිරිසේන

27 NOV 2014

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය
සඳහා ආර්ථික විද්‍යාව විෂය යටතේ
ඉදිරිපත් කරන නිබන්ධයයි.

**අපේක්ෂකයා ගේ ප්‍රකාශය**

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ධම්මිකා විතානගේ මහත්මියගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණයේ කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

2014.11.27 ............... ...............

දිනය අත්සන

## පර්යේෂණ උපදේශක ගේ නිර්දේශය

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, 2014. 09. 22 දින වාචික පරීක්ෂණයේ දී පරීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වාදී ඇති සංශෝධන මාගේ සුපරීක්ෂණය යටතේ නිවැරදි කර ඇති බවත්, මෙම පර්යේෂණ වාර්තාව ශාස්ත්‍රපති උපාධිය ලබාදීම සඳහා සුදුසු බවත් සහතික කරමි.

2014-11-27
..............
දිනය

..............
ආචාර්ය ධම්මිකා විතානගේ

# ස්තුතිය

මෙම පර්යේෂණ අධ්‍යයනය ආරම්භයේ සිට අවසානය දක්වා මා දිරිමත් කරමින් අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදුන් පර්යේෂණ උපදේශිකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ධම්මිකා විතානගේ මහත්මියටත්, පර්යේෂණ අධ්‍යයනයේ විවිධ පියවරවයන්හි දී අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදුන් එම අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කොට ගනිමි.

අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී නොමදව සහාය ලබාදුන් කුඩා තේ වතු සංවර්ධන සමිති නිලධාරී කාර්ය මණ්ඩලය හා කුඩා තේ වතු හිමියන් ලබාදුන් සහයෝගය ඉතා අගය කොට සලකමි.

ද්විතීයික දත්ත රැස්කිරීමේ දී අවශ්‍ය සහයෝගය ලබාදුන් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශන අංශයේ නිලධාරී කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත්, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුස්තකාලාධිපතිනී ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමෙන් සහයෝගය දැක්වූ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී එම්. බී. සිරිල් මහතා ඇතුළු සැමටත් මාගේ ස්තුතිය පිරිනමමි.

පර්යේෂණ වාර්තාව කියවා සෝදුපත් බැලීමෙන් සහාය දැක්වූ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනඥ නදී අමා ජයසේකර මහත්මියට හා මෙම අධ්‍යයන කාර්යයේ දී නන් අයුරින් සහයෝගය දැක්වූ සියලු දෙනාටත් මාගේ ස්තුතිය පිරිනමමි.

# පටුන

**පිටු අංකය**


අපේක්ෂකයා ගේ ප්‍රකාශය i

පර්යේෂණ උපදේශක ගේ නිර්දේශය ii

ස්තුතිය iii

පටුන iv

දත්ත වගු නාමාවලිය viii

ප්‍රස්ථාර සටහන් නාමාවලිය ix

රූප සටහන් නාමාවලිය x

වගු ඇමුණුම් ලේඛණය x

සංක්ෂිප්තය xii

**පළමු පරිච්ඡේදය**

හැඳින්වීම 01

1.1. අධ්‍යයන පසුබිම 01

1.2. අධ්‍යයනයේ වැදගත්කම 02

1.3. අධ්‍යයන ගැටලුව 13

1.4 අධ්‍යයනයේ මූලික අරමුණු 15

1.4.1 ප්‍රධාන අරමුණ 15

1.4.2 උප අරමුණු 15

1.5 පර්යේෂණ ක්‍රමවේදය 15

1.5.1 පර්යේෂණ දත්ත රැස්කිරීමේ ක්‍රමය 20

1.6 අධ්‍යයනයේ සීමා 20

1.7 නිබන්ධන සැකැසුම 21

දෙවන පරිච්ඡේදය

තේ වගා සාධක ඵලදායීතාව පිළිබඳ න්‍යායාත්මක පසුබිම හා පූර්ව අධ්‍යයන විවරණය 22

2.1 හැඳින්වීම 22

2.2 න්‍යායාත්මක පසුබිම 22

2.2.1 න්‍යායාත්මක රාමුව 23

2.2.2 කොබ් - ඩග්ලස් නිෂ්පාදන ආකෘතිය 24

2.3 සාහිත්‍ය විමර්ශනය 27

තෙවන පරිච්ඡේදය


ශ්‍රී ලංකාවේ තේ වගාවේ සාධක ඵලදායීතාව හා කුඩා තේ වතු සංවර්ධන සමිති 48

3.1 හැඳින්වීම 48

3.2 තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු අංශයේ දායකත්වය 48

3.2.1 භූගෝලීය පිහිටීම අනුව කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය52

3.2.2 තේ නිෂ්පාදන අපනයනයේ දී කුඩා තේ වතු අංශයේ වැදගත්කම 53

3.3 ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු අංශය සඳහා භූමිය යොදාගැනීම. 55

3.3.1 තේ වගා කරන රටවල භූමිය යොදාගැනීම 58

3.4 කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදන ඵලදායිතාව 59

3.4.1 ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන ඵලදායීතා මට්ටම 61

3.4.2 භූමියේ පිහිටීම අනුව තේ නිෂ්පාදනය ඵලදායිතාව 62

3.5 තේ අපනයන සඳහා කුඩා තේ වතු අංශයේ දායකත්වය 63

3.5.1 තේ නිෂ්පාදන කාණ්ඩය අනුව කුඩා තේ වතු අංශයට වන බලපෑම 64

3.5.2 තේ අපනයන කාණ්ඩ අනුව මිල තීරණය වීම 66

3.5.3 තේ අපනයන ඉපැයුම් දායකත්වය 67

3.6 කුඩා තේ වතු හිමියන් සඳහා තේ දළු මිල තීරණය වීම. 69

3.6.1 කුඩා තේ වතු අංශයේ නිෂ්පාදන පිරිවැය හා තේ දළු මිල 71

3.7 කුඩා තේ වතු අංශයේ වර්තමාන ස්වභාවය 74

3.7.1 කුඩා තේ ඉඩම් කැබලි වර්ගීකරණය 76

3.8 කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාකාරිත්වය 77

3.8.1 කුඩා තේ වතු සංවර්ධන සමිති අරමුණු 78

3.8.2 කුඩා තේ වතු සමිති සාමාජිකත්වය 78

3.8.3 තේ වගාවට අදාළ තාක්ෂණික පුහුණුව ලබාගැනීම 81

3.8.4 තේ නැවත වගාව හා නව වගාව 82

3.8.5 කුඩා තේ වතු සංවර්ධන සමිති හරහා ජාතික පොහොර සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීම 84

3.9 තේ දළු නිෂ්පාදන වියදම 84

3.9.1 තේ නැවත වගා කිරීමේ පිරිවැය හා වගා සහනාධාර 86

3.9.2 තේ වගාව සඳහා පොහොර භාවිතය 87

3.9.3 ප්‍රදේශ අනුව තේ දළු නෙලීමේ වාර ගණන 88

3.9.4 තේ වගාවේ ආදායම් වියදම් විශ්ලේෂණය 89

## සිව්වන පරිච්ඡේදය


රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගාවේ සාධක ඵලදායීතාව හා
කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාකාරිත්වය. 90

4.1 හැඳින්වීම 90
4.2 කුඩා තේ වතු හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය 90
4.2.1 ජනගහනය 90
4.2.2 අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය 93
4.3 නිවාස හා පානීය ජල පහසුකම් 94
4.4 තේ වගාවේ ආදායම් ව්‍යාප්තිය 96
4.4.1 තේ ගොවීන් මාසික වියදම් පියවාගන්නා ආකාරය 98
4.5 ඒක පුද්ගල තේ ඉඩම් පරිභෝජනය 99
4.5.1 තේ ඉඩම්වල අයිතිය 100
4.5.2 භූමි ප්‍රමාණය අනුව තේ ඉඩම් සංඛ්‍යාව 100
4.5.3 කුඩා තේ ඉඩම්වල ස්වභාවය 101
4.5.4 තේ වගා කිරීම 102
4.5.5 කුඩා තේ වතු ගොවීන්ගේ තේ නිෂ්පාදන ඵලදායීතාව 104
4.6 තේ නිෂ්පාදන සාධකවල ක්‍රියාකාරීත්වය සඳහා කුඩා තේ වතු සංවර්ධන
සමිතිවල දායකත්වය 105
4.6.1. පොහොර භාවිතය 105
4.6.2 තේ වගාවේ ස්වභාවය 109
4.6.3 පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය හා සෙවන පාලනය 111
4.6.4 කුඩා තේ වතු අංශයේ තේ දලු නෙළීම 112
4.6.5 තේ වගාවට අදාළ පුහුණුවීම් 113
4.6.6 තේ වගාවේ කටයුතු සඳහා ශ්‍රමය යොදාගැනීම 114
4.7 තේ නිෂ්පාදන ආකෘති ඇස්තමේන්තු කිරීම 116
4.7.1 තේ වගා සාධක ඵලදායීතාව සැසඳීම 120
4.7.2 සමිති සාමාජික තේ ගොවීන් ගේ තේ නිෂ්පාදනය හා ඵලදායීතාව
ඇස්තමේන්තු කිරීම 121
4.8 කුඩා තේ වතු ගොවීන්ගේ තේ නිෂ්පාදන
ඵලදායීතාව කෙරෙහි බලපාන ගැටලු 122

පස්වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| නිගමන හා යෝජනා | | 124 |
| 5.1 | හැඳින්වීම | 124 |
| 5.2 | නිගමන | 124 |
| 5.3 | යෝජනා | 129 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | | 134 |
| වගු ඇමුණුම් ලේඛණය | | 137 |
| ප්‍රශ්නාවලිය | | 146 |

## දත්ත වගු නාමාවලිය


| | | පිටු අංකය |
|---|---|---|
| වගු අංක 1.1 | තේ, රබර් හා පොල් අපනයන ඉපැයීම්වල සාපේක්ෂ වැදගත්කම | 03 |
| වගු අංක 1.2 | සමස්ත තේ නිෂ්පාදනයේ පරිමාණ සංයුතිය | 05 |
| වගු අංක 1.3 | තේ නිෂ්පාදන ඵලදායීතාව (කිලෝග්‍රෑම්/හෙක්ටයාර්) | 06 |
| වගු අංක 1.4 | කුඩා පරිමාණයේ තේ ඉඩම් ව්‍යාප්තිය | 07 |
| වගු අංක 1.5 | භූමි ප්‍රමාණය අනුව කුඩා තේ ඉඩම් කැබැලි සංඛ්‍යාව | 08 |
| වගු අංක 1.6 | දකුණු ඉන්දියානු වතු කම්කරුවන් ගේ පැමිණීම | 10 |
| වගු අංක 1.7 | කුඩා තේ වතු සමිති ක්‍රමයේ ව්‍යාප්තිය | 12 |
| වගු අංක 2.1 | ශ්‍රී ලංකාවේ තේ වගාවේ නිෂ්පාදන ඵලදායීතාව | 27 |
| වගු අංක 2.2 | තේ වගා කරුවන් හා තේ වගා බිම් ප්‍රමාණය (2013 වසර) | 41 |
| වගු අංක 3.1 | භූමියේ පිහිටීම අනුව තේ නිෂ්පාදනය (කිලෝ මිලියන) | 49 |
| වගු අංක 3.2 | වාර්ෂික තේ නිෂ්පාදනය ( කිලෝ මිලියන) | 51 |
| වගු අංක 3.3 | තේ නිෂ්පාදනය හා දේශීය පරිභෝජනය ( කිලෝ මිලියන) | 54 |
| වගු අංක 3.4 | තේ වගාව සඳහා ඉඩම් භාවිතය ( අක්කර) | 57 |
| වගු අංක 3.5 | තේ වගාව සඳහා භූමිය යොදාගැනීම (හෙක්ටයාර්) | 59 |
| වගු අංක 3.6 | තේ නිෂ්පාදන ඵලදායීතාව (හෙක්ටයාර් 1ක් සඳහා) | 60 |
| වගු අංක 3.7 | තේ ප්‍රභේද අනුව තේ නිෂ්පාදන ඵලදායීතාව (හෙක්ටයාර් 1ක් සඳහා) | 61 |
| වගු අංක 3.8 | තේ අපනයන සංයුතිය (කිලෝග්‍රෑම් මිලියන) | 65 |
| වගු අංක 3.9 | තේ අපනයන හා ඉපැයුම් (ඇමෙරිකානු ඩොලර්) | 67 |
| වගු අංක 3.10 | තේ දලු සඳහා කුඩා තේ වතු හිමියන්ට ලැබෙන මිල මට්ටම (කිලෝග්‍රෑමයට රුපියල්) | 70 |
| වගු අංක 3.11 | රිකිලි තේ සඳහා පැවතිය යුතු අවම මිල මට්ටම | 72 |
| වගු අංක 3.12 | බීජ තේ සඳහා පැවතිය යුතු අවම මිල මට්ටම | 73 |
| වගු අංක 3.13 | තේ දලු සඳහා පැවතිය යුතු අවම මිල හා වෙළෙඳපොළ මිල | 73 |
| වගු අංක 3.14 | කුඩා තේ ඉඩම් ව්‍යාප්තිය (හෙක්ටයාර්) | 75 |
| වගු අංක 3.15 | කුඩා තේ ඉඩම් වර්ගීකරණ (අක්කර) | 76 |
| වගු අංක 3.16 | කුඩා තේ වතු සමිති සාමාජිකත්වය | 79 |
| වගු අංක 3.17 | කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීම | 81 |
| වගු අංක 3.18 | තේ නැවත වගාව හා නව වගාව (හෙක්ටයාර්) | 83 |
| වගු අංක 3.19 | ප්‍රදේශ අනුව තේ දලු නිෂ්පාදන වියදම (රිකිලි තේ හෙක්ටයාර් 1ක් සඳහා රුපියල්) | 85 |
| වගු අංක 3.20 | ප්‍රදේශ අනුව තේ දලු නිෂ්පාදන වියදම (බීජ තේ හෙක්ටයාර් 1ක් සඳහා රුපියල්) | 85 |
| වගු අංක 3.21 | තේ නැවත වගාව සඳහා වියදම් ඇස්තමේන්තුව (හෙක්ටයාර් 1ක් සඳහා රුපියල්) | 86 |
| වගු අංක 3.22 | තේ නැවත වගා කිරීමේ පිරිවැය හා වගා සහනාධාර ( හෙක්ටයාරයට රුපියල්) | 86 |
| වගු අංක 3.23 | පොහොර වියදම (බීජ තේ හෙක්ටයාර් 1ක් සඳහා) | 88 |
| වගු අංක 3.24 | පොහොර වියදම (රිකිලි තේ හෙක්ටයාර් 1කට වසරකට ) | 88 |
| වගු අංක 3.25 | ප්‍රදේශ අනුව තේ දලු නෙලීමේ වාර ගණන | 88 |
| වගු අංක 3.26 | තේ වගාවේ ආදායම හා වියදම | 89 |

| | | |
|---|---|---|
| වගු අංක 4.1 | නියැදි සාමාජිකයින් ගේ පවුල්වල ජනගහනය | 91 |
| වගු අංක 4.2 | ස්ත්‍රී පුරුෂ බව අනුව කුඩා තේ ගොවීන් ගේ සංඛ්‍යාව | 92 |
| වගු අංක 4.3 | තේ ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම | 93 |
| වගු අංක 4.4 | නිවාසවල තත්ත්වය | 95 |
| වගු අංක 4.5 | පානීය ජල පහසුකම් භාවිතය | 95 |
| වගු අංක 4.6 | තේ වගාවේ මාසික ආදායම හා පවුලේ මාසික වියදම | 98 |
| වගු අංක 4.7 | තේ ඉඩම් පරිභෝජනය | 99 |
| වගු අංක 4.8 | තේ ඉඩම්වල අයිතිය | 100 |
| වගු අංක 4.9 | භූමි ප්‍රමාණය අනුව තේ ඉඩම් සංඛ්‍යාව | 101 |
| වගු අංක 4.10 | තේ වගාව ආරම්භ කර ඇති ආකාරය | 103 |
| වගු අංක 4.11 | කුඩා තේ වතු ගොවීන් ගේ තේ නිෂ්පාදන ඵලදායීතාව | 104 |
| වගු අංක 4.12 | පොහොර භාවිතය | 106 |
| වගු අංක 4.13 | නිර්දේශිත වාර ගණනට වඩා අඩුවෙන් පොහොර යෙදීමට බලපා ඇති හේතු | 107 |
| වගු අංක 4.14 | පොහොර භාවිත කිරීමේ ස්වභාවය | 107 |
| වගු අංක 4.15 | පොහොර අඩුවෙන් යෙදීමට බලපා ඇති හේතු | 108 |
| වගු අංක 4.16 | තේ වගාවට යොදන පොහොර පිළිබඳව තේ ගොවීන්ගේ ප්‍රතිචාර | 108 |
| වගු අංක 4.17 | වගාවේ පවතින තේ පඳුරු සංඛ්‍යාවේ ප්‍රමාණවත් බව | 109 |
| වගු අංක 4.18 | තේ වගාවේ තිබිය යුතු තේ පඳුරු ප්‍රමාණය නොමැතිවීමට බලපා ඇති හේතු | 110 |
| වගු අංක 4.19 | පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය හා සෙවන පාලනය | 111 |
| වගු අංක 4.20 | තේ වගාවට අදාළ පුහුණුවීම් ලබාගැනීම | 113 |
| වගු අංක 4.21 | තේ සමිතිය මගින් ලබාදෙන පුහුණුවීම්වල ගුණාත්මක බව | 114 |
| වගු අංක 4.22 | තේ වගාවේ කටයුතු සඳහා ශ්‍රමය සපයාගන්නා ආකාරය | 115 |
| වගු අංක 4.23 | තේ නිෂ්පාදන සාධක ඇස්තමේන්තු කිරීම | 116 |
| වගු අංක 4.24 | Model Summary[b] | 117 |
| වගු අංක 4.25 | ANOVA | 117 |
| වගු අංක 4.26 | Coefficients[a] | 117 |
| වගු අංක 4.27 | සාධක සහසම්බන්ධතාව | 120 |
| වගු අංක 4.28 | ඇස්තමේන්තු ගත ඵලදායීතාව (අක්කරයට නිමි තේ කිලෝග්‍රෑම්) | 121 |


## ප්‍රස්ථාර සටහන් නාමාවලිය


| | | පිටු අංකය |
|---|---|---|
| ප්‍රස්ථාර අංක 1.1 | තේ, රබර් හා පොල් අපනයන ඉපයීම්වල සාපේක්ෂ වැදගත්කම | 04 |
| ප්‍රස්ථාර අංක 1.2 | සමස්ත තේ නිෂ්පාදනයේ පරිමාණ සංයුතිය | 05 |
| ප්‍රස්ථාර අංක 1.3 | තේ නිෂ්පාදන ඵලදායීතාව (කිලෝග්‍රෑම්/හෙක්ටයාර්) | 07 |
| ප්‍රස්ථාර අංක 1.4 | භූමි ප්‍රමාණය අනුව කුඩා තේ ඉඩම් කැබැලි සංඛ්‍යාව | 08 |
| ප්‍රස්ථාර අංක 1.5 | දකුණු ඉන්දියානු වතු කම්කරුවන් ගේ පැමිණීම | 11 |
| ප්‍රස්ථාර අංක 2.1 | රටවල් කිහිපයක තේ නිෂ්පාදන ඵලදායීතාව - 2013 | 39 |
| ප්‍රස්ථාර අංක 2.2 | රටවල් කිහිපයක තේ නිෂ්පාදනය - 2013 වසර | 41 |
| ප්‍රස්ථාර අංක 2.3 | තේ වගා භූමි ප්‍රමාණය - 2013 වසර | 42 |
| ප්‍රස්ථාර අංක 3.1 | භූගෝලීය ප්‍රදේශ අනුව තේ නිෂ්පාදනය (කිලෝ මිලියන) | 50 |
| ප්‍රස්ථාර අංක 3.2 | තේ නිෂ්පාදන දායකත්වය (%) | 52 |
| ප්‍රස්ථාර අංක 3.3 | භූගෝලීය පිහිටීම අනුව තේ නිෂ්පාදනය (%) | 53 |
| ප්‍රස්ථාර අංක 3.4 | තේ නිෂ්පාදනය දායකත්වය (%) | 55 |
| ප්‍රස්ථාර අංක 3.5 | සමස්ත තේ ඉඩම් ප්‍රමාණය (අක්කර) | 56 |

| | | |
|---|---|---|
| ප්‍රස්ථාර අංක 3.6 | තේ වගාව සඳහා ඉඩම් භාවිතය (අක්කර) | 58 |
| ප්‍රස්ථාර අංක 3.7 | තේ නිෂ්පාදන ඵලදායීතාව ( හෙක්ටයාර්/කිලෝග්‍රෑම්) | 60 |
| ප්‍රස්ථාර අංක 3.8 | භූගෝලීය ප්‍රදේශ අනුව තේ නිෂ්පාදන ඵලදායීතාව (හෙක්ටයාර්/කිලෝග්‍රෑම්) | 62 |
| ප්‍රස්ථාර අංක 3.9 | තේ නිෂ්පාදනය හා අපනයනය (කිලෝ මිලියන) | 63 |
| ප්‍රස්ථාර අංක 3.10 | තේ අපනයන සංයුතිය | 65 |
| ප්‍රස්ථාර අංක 3.11 | අපනයන කාණ්ඩ අනුව මිල මට්ටම (රුපියල්) | 66 |
| ප්‍රස්ථාර අංක 3.12 | රටවල් කිහිපයක තේ අපනයන ඉපයීම් | 68 |
| ප්‍රස්ථාර අංක 3.13 | නිෂ්පාදන පිරිවැය හා දළු මිල | 72 |
| ප්‍රස්ථාර අංක 3.14 | අංශ අනුව තේ ඉඩම් ව්‍යාප්තිය | 75 |
| ප්‍රස්ථාර අංක 3.15 | කුඩා තේ වතු අංශයේ ව්‍යාප්තිය | 77 |
| ප්‍රස්ථාර අංක 3.16 | කුඩා තේ වතු සමිති සාමාජිකත්වය | 80 |
| ප්‍රස්ථාර අංක 3.17 | තාක්ෂණික පුහුණුවීම් ලබාගැනීම | 82 |
| ප්‍රස්ථාර අංක 3.18 | වගා සහනාධාර හා වගා පිරිවැය (රුපියල්) | 87 |
| ප්‍රස්ථාර අංක 4.1 | වයස් කාණ්ඩ අනුව තේ ගොවීන් | 92 |
| ප්‍රස්ථාර අංක 4.2 | තේ වගාවෙන් ලබන ආදායම - රුපියල් | 97 |
| ප්‍රස්ථාර අංක 4.3 | තේ ඉඩම්වල ස්වභාවය | 102 |
| ප්‍රස්ථාර අංක 4.4 | තේ නිෂ්පාදන ඵලදායීතාව | 105 |
| ප්‍රස්ථාර අංක 4.5 | පොහොර භාවිතය | 106 |
| ප්‍රස්ථාර අංක 4.6 | තේ දළු නෙළීම | 112 |


## රූප සටහන් නාමාවලිය


| | | |
|---|---|---|
| රූප සටහන් 1.1 | ඵලදායීතාව ක්‍රියාත්මක වන ආකාරය | 17 |
| රූප සටහන 2.1 | දිළිඳුකමේ දුෂ්ට චක්‍රය | 25 |
| රූප සටහන 2.2 | දිළිඳුකමේ දුෂ්ට චක්‍රය ක්‍රියාත්මක වන ආකාරය | 25 |
| රූප සටහන 2.3 | දකුණු ඉන්දීය නිල්ගිරි කඳුකර තේ වතාකරුවන් ගේ සංවිධාන ගතවීම | 36 |
| රූප සටහන 2.4 | ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන් ගේ සංවිධාන රටාව | 37 |


## වගු ඇමුණුම් ලේඛණය


| | | |
|---|---|---|
| ඇමුණුම් අංක 1.1 | ප්‍රධාන වැවිලි භෝගවල අපනයන ඉපයීම්වල දායකත්වය | |
| 1376 | | |
| ඇමුණුම් අංක 1.2 | සමස්ත තේ නිෂ්පාදනයේ පරිමාණ සංයුතිය | 137 |
| ඇමුණුම් අංක 1.3 | තේ නිෂ්පාදන ඵලදායීතාව (කිලෝග්‍රෑම්/ හෙක්ටයාර්) | 137 |
| ඇමුණුම් අංක 1.4 | භූමි ප්‍රමාණය අනුව කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාව | 137 |
| ඇමුණුම් අංක 1.5 | කුඩා තේ වතු සමිති ක්‍රමයේ ව්‍යාප්තිය | 138 |
| ඇමුණුම් අංක 3.1 | භූමියේ පිහිටීම අනුව තේ නිෂ්පාදනය (කිලෝ මිලියන) | 138 |
| ඇමුණුම් අංක 3.2 | වාර්ෂික තේ නිෂ්පාදනය (කිලෝ මිලියන) | 138 |

| | | |
|---|---|---|
| ඇමුණුම් අංක 3.3 | භූගෝලීය පිහිටීම අනුව තේ නිෂ්පාදනය (කිලෝග්‍රෑම් මිලියන) | 139 |
| ඇමුණුම් අංක 3.4 | තේ නිෂ්පාදිත රටවල නිෂ්පාදන දායකත්වය (%) | 139 |
| ඇමුණුම් අංක 3.5 | තේ නිෂ්පාදන ඵලදායීතාව ( හෙක්ටයාර් 1ක් සඳහා) | 140 |
| ඇමුණුම් අංක 3.6 | තේ නිෂ්පාදනය හා අපනයනය (කිලෝග්‍රෑම් මිලියන) | 140 |
| ඇමුණුම් අංක 3.7 | තේ අපනයන කාණ්ඩ අනුව මිල මට්ටම (කිලෝග්‍රෑමයට රුපියල්) | 140 |
| ඇමුණුම් අංක 3.8 | ප්‍රදේශ අනුව කොළඹ තේ වෙන්දේසියේ මිල (කිලෝග්‍රෑමයට රුපියල්) | 140 |
| ඇමුණුම් අංක 3.9 | කුඩා තේ වතු අංශයේ තේ දලු මිල හා නිෂ්පාදන පිරිවැය (කිලෝග්‍රෑමයට රුපියල්) | 141 |
| ඇමුණුම් අංක 3.10 | දිස්ත්‍රික්ක අනුව කුඩා තේ ඉඩම් ව්‍යාප්තිය ( හෙක්ටයාර්) | 141 |
| ඇමුණුම් අංක 3.11 | අංශ අනුව තේ ඉඩම් ව්‍යාප්තිය ( හෙක්ටයාර්) | 142 |
| ඇමුණුම් අංක 3.12 | තේ ඉඩම් ප්‍රමාණය ( හෙක්ටයාර්) | 142 |
| ඇමුණුම් අංක 4.13 | කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාකාරිත්වය | 142 |
| ඇමුණුම් අංක 3.14 | තේ වගා ආධාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (රුපියල් මිලියන) | 143 |
| ඇමුණුම් අංක 3.15 | භූමි ප්‍රමාණය අනුව කුඩා තේ ඉඩම් ව්‍යාප්තිය | 143 |
| ඇමුණුම් අංක 4.1 | වයස් කාණ්ඩ අනුව ජනගහනය | 143 |
| ඇමුණුම් අංක 4.2 | තේ ගොවීන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අධ්‍යාපන මට්ටම | 144 |
| ඇමුණුම් අංක 4.3 | තේ වගාවෙන් ලබන ආදායම | 144 |
| ඇමුණුම් අංක 4.4 | නියැදියේ ආදායම් ව්‍යාප්තිය සෙවීම (ගිණි සංගුණකය සෙවීම) | 144 |
| ඇමුණුම් අංක 4.5 | කුඩා තේ වතු ගොවීන් පවුලේ මාසික වියදම් පියවා ගන්නා ආකාරය | 144 |
| ඇමුණුම් අංක 4.6 | කුඩා තේ වතු ගොවීන් ගේ ඉඩම්වල ස්වභාවය | 145 |
| ඇමුණුම් අංක 4.7 | කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදන ඵලදායීතාව (2013 වසර) | 145 |
| ඇමුණුම් අංක 4.8 | තේ දලු නෙළන ආකාරය | 145 |
| ඇමුණුම් අංක 4.9 | ඵලදායීතාව ඇස්තමේන්තු කිරීම | 145 |

## සංක්ෂිප්තය

යටත් විජිත ක්‍රමය ව්‍යාප්ත කළ බ්‍රිතාන්‍ය විසින් තේ ආර්ථික භෝගය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රමුඛව කටයුතු කර ඇත. ලොව බොහෝ රටවල් සමග ආර්ථික ක්‍රියාදාමයකට යොමුකිරීමට තේ නිෂ්පාදනයට හැකි වී ඇත. තේ නිෂ්පාදයට අදාළ නිෂ්පාදන සාධක භාවිත කර ඇති ආකාරය එහි ඉතිහාස තොරතුරු මගින් පෙන්නුම් කරයි. තේ නිෂ්පාදනයේ විවිධ පර්යේෂණ මත නව නිෂ්පාදන සාධක හඳුනාගැනීම ද, එමගින් තේ නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක වර්ධනය ද දක්නට ඇත. මෙරටේ තේ නිෂ්පාදන අංශයේ ව්‍යුහාත්මක වෙනස්වීම 1950 දශකය තුළ ආරම්භ වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කුඩා තේ වතු අංශය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව පෙරට පැමිණ ඇත. මෙලෙස ව්‍යාප්ත වෙමින් ක්‍රියාත්මක වන තේ නිෂ්පාදන අංශය, වතු අංශය හා කුඩා තේ වතු අංශය ලෙස වෙන් වෙන්ව ක්‍රියාත්මක වේ. මෙම පර්යේෂණ අධ්‍යයනයේ දී තේ නිෂ්පාදන අංශය තුළ කුඩා තේ වතු හිමියන්ගේ තේ වගා සාධක ඵලදායීතාව තීරණය වන අන්දම පරීක්ෂා කිරීමත්, ඒ සඳහා කුඩා තේ වතු සංවර්ධන සමිතියේ දායකත්වය පරීක්ෂා කිරීම ප්‍රධාන අරමුණ විය. මෙම අධ්‍යයනය සිදුකිරීම සඳහා කොබ් - ඩග්ලස් නිෂ්පාදන ඵලදායීතා ආකෘතිය මත න්‍යායික පදනම සකස්කර ගන්නා ලද අතර, එම අධ්‍යයනය සඳහා කුඩා තේ වතු හිමියන් වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වන රත්නපුර දිස්ත්‍රික්කයෙහි කුඩා තේ වතු සංවර්ධන සමිති තුනක තේ ගොවීන් 150 දෙනෙකු අධ්‍යයනයට භාජනය කරන ලදී. තේ නිෂ්පාදනයට අදාළ නිෂ්පාදන සාධකවලට අනුව ප්‍රමාණාත්මක සාධක මත නිෂ්පාදනය වැඩි කිරීම ද, පසුව ගුණාත්මක වශයෙන් නිෂ්පාදන සාධක යොදාගැනීම ද දක්නට ඇත. කුඩා තේ වතු ගොවීන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වන තේ දළු නිෂ්පාදනය ඔවුන්ගේ ජීවන තත්වයට විශාල දායකත්වයක් සපයයි. කුඩා තේ වතු ගොවීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා තේ නිෂ්පාදනයට යොදාගනු ලබන නිෂ්පාදන සාධකවල ඵලදායී භාවිතය ඉතා වැදගත් වේ.

අධ්‍යයන ප්‍රතිඵලවලට අනුව කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදන ඵලදායීතාව සඳහා කුඩා තේ වතු සමිති සාමාජික තේ ගොවීන් වැඩි දායකත්වයක් ලබාදී ඇති බව දක්නට ඇත. කුඩා තේ වතු හිමියන් සඳහා විවිධ වැඩසටහන් හඳුන්වා දී ඇති අතර, ග්‍රාමීය මට්ටමින් ඒවා සම්බන්ධීකරණය කිරීමේ ආයතනික ව්‍යුහයක් ලෙස කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාත්මක වේ. එසේ වුවද, කුඩා තේ වතු ගොවීන්ගෙන් විශාල ප්‍රමාණයක් මෙම සමිති සමග සම්බන්ධවී නොමැති ආකාරය දක්නට ඇත. අධ්‍යයනයේ නිගමනවලට අනුව කුඩා තේ වතු අංශයේ නිෂ්පාදන ඵලදායීතා මට්ටම සඳහා කුඩා තේ වතු සමිති සාමාජික තේ ගොවීන් ඉහළ දායකත්වයක් ලබාදෙන ආකාරය දක්නට ඇත. මෙම නිෂ්පාදන ඵලදායීතා මට්ටම තවදුරටත් ඉහළ නංවා ගැනීමේ හැකියාව දක්නට ඇති අතර, කුඩා තේ වතු අංශය සඳහා ගණනය කරන ලද තේ නිෂ්පාදන ඵලදායීතා ආකෘතියට අනුව පවත්නා ඵලදායීතා මට්ටම සඳහා බලපා ඇති හේතු රාශියක් හඳුනාගත හැක. ඉන් ප්‍රධාන ලෙස, නිර්දේශිත වගා තාක්ෂණික ක්‍රම අනුව තේ වගා නොකිරීම, කල් ඉකුත්වූ හා කල් ඉකුත්වීමට ආසන්න තේ වගාවන් පැවතීම, තේ වගා භූමියට සාපේක්ෂව පවත්වා ගත යුතු තේ පඳුරු ප්‍රමාණය පවත්වා නොගැනීම, නිසි පරිදි පොහොර භාවිත නොකිරීම හා තේ දළු නෙළීමේ කාල අතර විවිධ මට්ටම් පැවතීම, තේ වගාවට අදාළ ව්‍යාප්ති සේවා නිසි පරිදි ගලපා නොගැනීම, තේ ගොවීන්ගේ දැනුම යාවත්කාලීන නොවීම, තාක්ෂණික උපදෙස් අනුව ගුණාත්මක තේ පැළ වගා නොකිරීම හඳුනාගත හැක. කුඩා තේ වතු  අංශයේ පවත්නා මෙම තත්ත්වය ඉවත් කිරීම මගින් එම අංශයේ තේ නිෂ්පාදන ඵලදායීතා මට්ටම තවදුරටත් ඉහළ නංවා ගැනීමේ හැකියාව ඇත.

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1. අධ්‍යයන පසුබිම

සියවස් එක හමාරක පමණ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ තේ වගාව යටත් විජිත යුගයෙන් ආරම්භ වී අද දක්වා ක්‍රියාත්මක වන නිෂ්පාදන අංශයකි. කාර්මීකරණය හා තාක්ෂණික දියුණුව සමඟ මෙරට ආර්ථිකයේ බොහෝ අංශ වර්ධනය වූ අතර, තේ නිෂ්පාදන අංශය ද තවදුරටත් ව්‍යාප්ත වෙමින් වර්ධනය අත්කර ගැනීමට සමත් වූ ආර්ථික අංශයක් බවට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමෙන් 14% ක ප්‍රමාණයක් හා, දළ දේශීය නිෂ්පාදිතයට 0.9% ක දායකත්වයක් සපයන තේ නිෂ්පාදන අංශය, තෙත් කලාපයට අයත් කඳුකර ප්‍රදේශ හා පහත් බිම් ප්‍රදේශ තුළ ව්‍යාප්තව පවතින අතර, දිස්ත්‍රික්ක 14 ක් තුළ හෙක්ටයාර් 221,968 ක භූමි ප්‍රමාණයක තේ වගාව ව්‍යාප්තව ප්‍රධාන නිෂ්පාදන අංශයක් බවට පත්ව ඇත (කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, වාර්ෂික වාර්තාව 2013). ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන අංශය, දේශීය ආර්ථිකයට දක්වන දායකත්වය අතීතයේ සිට අද දක්වා සැළකිය යුතු මට්ටමක පවතී. මුල් කාලයේ දී මෙරට ආර්ථිකයේ අනෙකුත් අංශ අභිබවා කෘෂිකාර්මික අංශය කැපීපෙනෙන දායකත්වයක් ලබාදුන් අතර කාර්මීකරණය හා තාක්ෂණික දියුණුව සමඟම කාර්මික හා සේවා අංශවල වර්ධනය මෙම අංශය අභිබවා ගිය ද, දේශීය ආර්ථිකයට කෘෂිකාර්මික අංශයෙන් දක්වන දායකත්වය ඉහළ මට්ටමක පවතී.

ප්‍රධාන වැවිලි භෝගවලට අමතරව සුළු අපනයන භෝග, වී ගොවිතැන, ධීවර කටයුතු ආදී අංශවලින් ද තේ නිෂ්පාදන අංශයට අතීතයේ සිට මේ දක්වා ප්‍රධාන තැනක් හිමිවී ඇත. ශ්‍රී ලංකාවේ තේ වගාව 1867 වර්ෂයේ දී ආරම්භවී ඇති අතර, මුල් දශක තුනක් ඇතුළත තේ වගාව විශ්මය ජනක ලෙස ව්‍යාප්තවීමට නොයෙක් සාධක උපකාරීවී ඇත. යුරෝපයේ ප්‍රචලිතවූ අමද්‍යප ව්‍යාපාරය නිසා මත් නොවන උත්තේජන පානයක් ලෙස තේ සඳහා ඇති ඉල්ලුම වැඩි විය. බ්‍රිතාන්‍යයේ ඒක පුද්ගල තේ පාරිභෝජනය වැඩිවීම ද මෙහි ව්‍යාප්තිය සඳහා විශේෂ වැදගත්කමක් ගෙන ඇත. දහ නව වන ශත වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම්වලින් අඩකටත් වැඩි ප්‍රමාණයක් දායක කරන ලද්දේ තේ අපනයනයයි. ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත්කරන ලද 2013 වසරේ සංඛ්‍යා ලේඛනවලට අනුව කෘෂිකාර්මික අංශය මෙරට දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ලද දායකත්වය 9.5% කි. කෘෂිකාර්මික නිෂ්පාදන අංශය තුළ තේ, පොල්, රබර් වැනි වැවිලි භෝග ද, සාම්ප්‍රදායික කෘෂිකාර්මික භෝගයන් ගෙන් ද සමන්විත වන අතර තේ නිෂ්පාදන අංශයේ දායකත්වය ඉහළ අගයක් පෙන්නුම් කරයි. තේ නිෂ්පාදන අංශය ශ්‍රමය බහුලව යොදාගනු ලබන නිෂ්පාදන අංශයක් වන අතර මෙම අංශය ද සහිත කෘෂිකාර්මික අංශය 2013 වර්ෂය තුළ ඉහළ සේවා නියුක්ති දායකත්වයක් ලබාදී ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 2013). ග්‍රාමීය මට්ටමේ දී හා වතු ආශ්‍රිතව විශාල සේවා නියුක්තියක් තේ නිෂ්පාදන අංශය තුළ දක්නට ඇත.

යටත් විජිත සමය තුළ ඇරඹි තේ වගාව කඳුකර ප්‍රදේශයෙන් ආරම්භවී මැදරට තෙත් කලාපයත්, පහතරට තෙත් කලාපයත් ආවරණය වන ලෙස ව්‍යාප්ත වී ඇත. ආරම්භක අවධියේ සිට තේ වගාව විශාල ප්‍රමාණයේ තේ වතු ලෙස පවත්වාගෙන ගිය අතර, එය 1970 දශකය දක්වාම ක්‍රියාත්මක විය. නිදහසින් පසුව මෙරටේ ඇති වූ පරිපාලන ව්‍යුහාත්මක වෙනස්කම් මත විශාල ප්‍රමාණයේ වගාවන් තවදුරටත් ඒ